**#mediaethicsSL #EnglishPress #SinhalaPress #lka #Divaina #June20**

දිවයින පුවත්පත මගින් පළ කොට ඇති ප්‍රවෘත්තියක, මත්ද්‍රව්‍ය භාවිතා කරන්නෙකු මත්ද්‍රව්‍ය සන්තකයේ තිබියදීම අත් අඩංගුවට ගත් බව වාර්තා වී ඇත. මෙම පුවතේ සැකකරුගේ මුල් නම සඳහන් වී ඇති අතර, ඔහු උපාධිධාරියෙකු බවද සිරස්තලයේ සඳහන් කරයි. එසේම මෙම සැකකරු විසින් ලබාගත් උපාධි සහ ඩිප්ලෝමා සම්බන්ධයෙන්ද, ඔහු පෙර කරමින් සිටි රැකියාව සම්බන්ධයෙන්ද විස්තීර්ණව තොරතුරු සඳහන් කරයි. මෙහිදී සෘජුවම සැකකරුවෙකුගේ අනන්‍යතාවය හෙළිකිරීමක් දක්නට නැතත්, මෙතරම් දීර්ඝ වශයෙන් "සැකකරුවෙකු" පිළිබඳව තොරතුරු අවශ්‍ය වන්නේද යන්න ප්‍රශ්නකාරී වේ.
මෙහිදී ඔහුගේ ඉගෙනීම සහ තත්වය සඳහන් කිරීමේ බලාපොරොත්තුව වන්නේ, මත්ද්‍රව්‍ය වැනි සමාජ උවදුරකට කෙතරම් සමාජ තරාතිරමක පුද්ගලයෙකුට වුව ලඟා විය හැකි බව පෙන්වීමට විය හැක. නමුත් මෙතරම් විස්තර අවශ්‍ය වේද යන්න සැබවින්ම සංවාදයට ගත යුතු කරුණකි.